මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 04 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) බාහිර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 14 කට අදාළ රු.730,615 ක අත රැඳවුම් මුදල් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2014 වර්ෂයේ දී ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 03 කට අදාළ මුදල් 2015 මාර්තු 24 දින කොන්ත්‍රාත්කරුට ගෙවා තිබිය දී, දෙවරක් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ණයහිමි වටිනාකම රු.1,255,018 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2014 වර්ෂය තුළ දී බාහිර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු කර, පසුව අවලංගු කර තිබූ රු.10,049,000 ක එකතු වටිනාකමක් සහිත කර්මාන්ත 38 ක් කර්මාන්ත ණයගැතියන් යටතේ හා ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ රු.3,000,000 ක් වටිනා විදුලි ජනක යන්ත්‍ර 02 ක් මිල දී ගැනීමට මිල ගණන් කැඳවා ඇතත්, භාණ්ඩ ඇණවුම් කිරීමට හෝ ලබා ගැනීමට කටයුතු නොකර එම වටිනාකම ණයහිමියන් යටතේ ගිණුම්ගත කර පොදු ගබඩා ගිණුමට හර කර තිබීමෙන් වර්ෂයේ පොදු ගබඩා ශේෂය හා වගකීම් රු.3,000,000 ක මුදලකින් වැඩිපුර දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

**ගිණුම් විෂයයන් 08 කට අදාළ පාලන ගිණුම් අනුව, ශේෂයන්ගේ එකතුව රු.21,775,743 ක් වුවත්, උපයෝගී ලේඛන අනුව එම ශේෂයන්ගේ එකතුව රු.20,120,340 ක් වූයෙන්, රු.1,655,403 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.**

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(අ) ලැබිය යුතු ගිණුම්**

**2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 07 ක එකතු වටිනාකම රු.124,786,190 ක් වූ අතර, එයින් අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හි එකතුව රු.15,342,421**

ක් විය. අවුරුදු **01** ත් **05** ත් අතර කාලයට අදාළ හිඟ ගිණුම් ශේෂයන් හි එකතුව රු.**57,379,514** ක් වී තිබුණි. **2018** ජූලි **24** දිනට රු.**120,993,080** ක ශේෂයක් තවදුරටත් අය විය යුතුව පැවතුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් **31** දිනට රු.**48,106,550** ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ **02** ක එකතු වටිනාකමින් අවුරුදු **05** ක කාලයක් ඉක්මවා තිබූ ශේෂවල එකතුව රු.**884,414** ක් වූ අතර, අවුරුදු **01** ත් **05** ත් අතර කාලයකට අදාළ හිඟ ශේෂවල එකතුව රු.**21,439,853** ක් වී තිබුණි. **2018** ජූලි **24** දිනට රු.**33,922,254** ක ශේෂයක් තවදුරටත් ගෙවිය යුතුව පැවතුණි.

**1.3.4** විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

(අ) ගිණුම් විෂයයන් **04** කට අදාළ ලේඛන හා ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.**13,695,802** ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ආ) රු.**6,487,162** ක් වටිනා ජල ගබඩා උපකරණ ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇතත්, එහි වටිනාකම හා ප්‍රමාණයන් තහවුරු වන පරිදි ජල ගබඩා ලේඛනයක් විගණනයට ඉදිරිපත් නොකළ අතර, ජල ගබඩාවේ තිබුණු ජල නළ උපාංග අයිතම **172** ක වටිනාකම් ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**1.3.5** අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | **1988** ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති **218** | -- | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව වාර්ෂික සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>මුදල් රෙගුලාසි **371(2)** | **8,692** | නිකුත් කර තිබුණු අත්තිකාරම් අදාළ කාර්යය නිම කළ වහාම පියවිය යුතු වුවත්, **2007, 2009** වර්ෂයන් තුළ ලබා දී තිබූ අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද සංශෝධිත මූල්‍ය ප්‍රකාශන අනුව, **2017** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.**25,346,908** ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.**54,622,205** ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 8,726,970 | 8,562,664 | 8,729,462 | 7,518,534 | 9,677,160 | 10,182,831 | 11,340,941 | 7,685,333 |
| (ii) | කුලී | 815,000 | 564,000 | 564,000 | 495 | 1,610,000 | 570,400 | 711,400 | 495 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,906,000 | 1,123,099 | 1,123,099 | -- | 3,705,000 | 3,113,911 | 3,113,911 | -- |
| (iv) | වෙනත් ආදායම් | 37,518,000 | 23,187,062 | 31,786,671 | 84,656,882 | 66,162,000 | 58,483,525 | 98,792,021 | 89,129,069 |
| | එකතුව | 50,965,970 | 33,436,825 | 42,203,232 | 92,175,911 | 81,154,160 | 72,350,667 | 113,958,273 | 96,814,897 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සමස්ත ආදායම් ප්‍රභවයන්ගෙන් **2016** දෙසැම්බර් **31** දිනට පැවති හිඟය රු.**96,814,897** ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එම වටිනාකම රු.**92,175,911** ක් විය.

#### 2.2.3 වරිපනම් හා බදු

(අ) වරිපනම්

(i) වර්ෂ ගණනාවක සිට රජයේ ආයතනවලින් අය විය යුතු රු.**581,998** ක වරිපනම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) **1993 – 2017** කාල පරිච්ඡේදය තුළ පෞද්ගලික දේපළහිමියන්ට අයත් වරිපනම් ඒකක **350** කින් හිඟ හිටි වරිපනම් රු.**1,524,572** ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර, මේ සම්බන්ධයෙන් **1987** ප්‍රාදේශීය සභා පනතේ **159** වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iii) **2017 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් ශේෂය රු.7,608,345 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දින දක්වා බිල් කිරීම් රු.8,079,199 ක් විය. 2017 දෙසැම්බර් 31 දින වන විට හිඟයෙන් හා බිල් කිරීමෙන් අය කර තිබුණේ පිළිවෙලින් රු.3,357,618 ක් හා රු.4,888,173 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 44 ක් සහ සියයට 61 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දිනට රු.7,441,753 ක හිඟ ශේෂයක් පැවතුණි.**

**(ආ)** අක්කර බදු

**2017 ජනවාරි 01 දිනට හිඟ අක්කර බදු ශේෂය රු.17,037 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දින වන විට එම හිඟයෙන් අය කර තිබුණේ රු.160 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 0.9 ක් විය. මේ අනුව, හිඟ අක්කර බදු අය කිරීම ඉතා දුර්වල මට්ටමක පැවතුණි.**

**2.2.4** බලපත්‍ර ගාස්තු

**2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත හා ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව 2008 ක් වූ ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත පරිදි පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා දිය යුතු කර්මාන්ත 03 ක් වෙනුවෙන් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර නොතිබූ අතර, මේ හේතුවෙන් සභා අරමුදලට රු.12,000 ක මුදලක් අහිමි වී තිබුණි.**

**2.2.5** උසාවි දඩ හා මුද්දර ගාස්තු.

**පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,264,558 ක් හා මුද්දර ගාස්තු රු.82,392,324 ක් අය වියයුතුව තිබුණි.**

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කාර්යසාධනය

**ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.**

**(අ)** අතුරු ව්‍යවස්ථා

**සමාලෝචිත වර්ෂයේ දී හා ඉකුත් වර්ෂයේ දී බැකෝ යන්ත්‍රය කුළියට දීම, ක්‍රීඩා භූමි හා ප්‍රජාශාලා වෙන් කිරීම වෙනුවෙන් පිළිවෙළින් රු.866,600 ක හා රු.162,000 ක ආදායමක් උපයා ගෙන තිබුණ ද, අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ගෙන නොතිබුණි.**

**(ආ)** අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 22 වගන්තියේ සඳහන් අරමුණු ඉටු කර ගැනීම සඳහා වැඩසටහන් අංක 03 යටතේ 304 – 3 වැය විෂයය කාණු අලුත්වැඩියා කිරීම හා**

නඩත්තුව වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට වෙන් කර තිබූ රු.300,000 ක මුළු ප්‍රතිපාදනයම සහ 304 – 4 වැය විෂයය මංමාවත් හා පදික වේදිකා අලුත්වැඩියා කිරීම හා නඩත්තුව වෙනුවෙන් වෙන් කර තිබූ රු.500,000 ක ප්‍රතිපාදනවලින් රු.483,000 ක ප්‍රතිපාදන උපයෝජනය කර, අදාළ කාර්යයන් ඉටු කිරීමට කටයුතු කිරීමකින් තොරව වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

(ඈ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

---

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78(1) වගන්තියේ දක්වා ඇති අරමුණු ඉටු කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ මහජන සෞඛ්‍ය වැඩසටහන අංක 02 යටතේ 205 – 7 වැය විෂයය සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා වෙනුවෙන් වෙන් කර තිබූ රු.75,000 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුළ දී උපයෝජනය කර අදාළ කාර්යයන් ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) අත්හැර දැමූ ව්‍යාපෘති

---

2015 වර්ෂයේ රු.480,000 ක් වැය කර මැද්දේපතන සුසාන භූමියේ බයෝ ගෑස් ව්‍යාපෘතියක් ඉදිකර ඇතත්, 2018 ජූනි 26 දින වන විටත් බයෝ ගෑස් නිෂ්පාදනය කිරීමකින් තොරව අදාළ ව්‍යාපෘතිය අතරමඟ නවතා තිබුණි.

(ඉ) ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

---

(i) සභා අරමුදලින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කර්මාන්ත 38 ක් සඳහා ව්‍යාපෘති වාර්තා සකස් කර 2017 මාර්තු 21, ජූනි 29, සැප්තැම්බර් 28 සහ නොවැම්බර් 16 දිනයන් හීදි අනුමැතිය සඳහා ඉදිරිපත් කර 2017 ජූනි 17, අගෝස්තු 16, නොවැම්බර් 09 සහ දෙසැම්බර් 19 දිනයන් හීදි අනුමත කරවා ගෙන තිබුණි. පූර්ව වර්ෂයේ දී ව්‍යාපෘති හඳුනා ගෙන අනුමත කරවා ගෙන සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී කර්මාන්ත ඉටු කිරීම ආරම්භ කළ යුතු වුවත්, වර්ෂය අවසානය දක්වා ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාවලියක් අනුගමනය කිරීම හේතුවෙන් කාර්යසාධනය දුර්වල මට්ටමක පැවතුණි.

(ii) අනුමත කරන ලද රු.3,950,000 ක් වටිනා සංවර්ධන යෝජනා 11 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඊ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---

දෛනිකව කසළ ටොන් 03 ක් පමණ එකතු කරනු ලබන අතර, ප්‍රාදේශීය සභාව සතුව කසළ බැහැර කිරීම සඳහා ඉඩමක් නොමැති වීම හේතුවෙන් දිරන කසළ ටොන් 01 කට රු.500 ක් බැගින් ගෙවා කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව සතු කසළ අංගනයට බැහැර කරමින් තිබුණි. මේ සඳහා වර්ෂයකට රු.540,000 ක් පමණ අමතර වැය බරක් දරන අතර, සභාව විසින් කසළ ප්‍රතිචක්‍රීකරණය/ නැවත භාවිතයට ගත හැකි ආකාරයේ වැඩ පිළිවෙළක් සහිතව කසළ කළමනාකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

(උ) තිරසර සංවර්ධන ඉලක්ක
---------------------------

(i) තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාළව මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද, යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

(ii) එම කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද, ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයක් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) සංයුක්ත සැලැස්ම
-------------------

(i) ආයතනයේ සියලුම අංශයන් නියෝජනය වන පරිදි සමස්ත කටයුතු සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සභාව විසින් 2017 සිට 2020 දක්වා පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්මට සංවර්ධන ව්‍යාපෘතීන් පමණක් ඇතුළත් කර තිබුණි.

(ii) සංවර්ධන අංශය සඳහා පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම අනුව, සමාලෝචිත වර්ෂය තුළ දී කර්මාන්ත 31 ක් ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබුණ ද, ඉන් ක්‍රියාත්මක කර තිබුණේ කර්මාන්ත 07 ක් පමණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
--------------------------------

(අ) සභාව විසින් පවත්වා ගෙන ගොස් තිබූ ජල යෝජනා ක්‍රම වෙනුවෙන් අවස්ථා 03 කදී මහනුවර මහා නගර සභාවේ තැන්පත් කර තිබූ රු.265,000 ක තැන්පතු මුදල් හා ඒ සඳහා විදුලිය ලබා ගැනීම වෙනුවෙන් ලංකා විදුලි බල මණ්ඩලයේ අවස්ථා 02 කදී තැන්පත් කර තිබූ රු.7,500 ක තැන්පත් මුදල් ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ දී වරිපනම් බදු අය කළ හැකි දියුණු ප්‍රදේශ වශයෙන් ඒකක 4844 ක් හඳුනා ගෙන ඇතත්, එකී දේපළ සඳහා වරිපනම් බදු අය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(ඇ) රු.74,021,557 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි අයිතම 11 ක ඉඩමේ සහ ගොඩනැගිල්ලේ වටිනාකම වෙන් වෙන් වශයෙන් ස්ථාවර වත්කම් ලේඛනය තුළ දක්වා නොතිබුණි.

(ඈ) සභාවේ මුදල් භාරකරු වූ සරප් නිලධාරීයා වෙත අත්තිකාරම් ලබා දීමේ හැකියාවක් නොතිබිය දී හා කලින් ලබා ගත් අත්තිකාරම් පියවා නොතිබිය දී, දිගින් දිගටම විවිධ කාර්යයන් සඳහා අත්තිකාරම් ලබා දී තිබුණි. එසේම, මුදල් රෙගුලාසි 371(2)(අ) වගන්තියේ විධිවිධාන අනුගමනය කිරීමකින් තොරව බොහෝ ප්‍රමාදව අත්තිකාරම් පියවා තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය
----------------------------------

(අ) 2017 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව අතර තනතුරු 14 ක පුරප්පාඩු පැවතුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ අනියම් මුරකරුවෙකු හා අතිරික්ත පෙර පාසල් සහායිකාවක සේවයෙහි යොදවා ගෙන තිබුණි.

(ඇ) 2017 මැයි 06 දිනැති අංක CPC/CLG/2/5/විගණන දරන පළාත් පාලන කොමසාරිස්වරයාගේ ලිපියකින් කම්කරු ශ්‍රේණිවල සේවකයින් කාර්යාල කටයුතුවල යොදවා ගැනීමෙන් වළකින ලෙස පළාත් පාලන ආයතන දැනුවත් කර තිබිය දී, කාර්යාල කම්කරු, ක්ෂේත්‍ර කම්කරු හා

සෞඛ්‍ය කම්කරු තනතුරු දරන පුද්ගලයින් 09 දෙනෙකු වෙත කාර්යාලගත විවිධ විෂයන්ට අදාළ වගකිව යුතු රාජකාරී පවරා තිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------

වර්ෂ 05 කට වරක් හෝ නව වරිපනම් තක්සේරුවක් ක්‍රියාත්මක කළ යුතු වුවත්, වර්ෂ 08 ක් ඉකුත් වී තිබියදීත්, 2008 වර්ෂයේ වරිපනම් තක්සේරුව මතම 2017 වර්ෂයේ දීත් වරිපනම් අය කර තිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

---------------------------

3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

-------------------------------------------

සභාව සතු වාහන ගාල් කර තැබිය හැකි අංගනයක් නොමැති වීමෙන් සභාව සතු වාහන ස්වාභාවික ආපදාවන්ට ලක් වෙමින් පැවතුණි.

3.5.2 පවරා නොගත් වත්කම්

-------------------------

සභාව පරිහරණය කරනු ලබන රු.24,519,426 ක් වටිනා ඉඩම්, ගොඩනැගිලි, ක්‍රීඩා පිටි, සුසාන භූමි හා ප්‍රජාශාලා ඒකක 77 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5.3 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

(අ) සභාව සතු රු.2,290,000 ක් වටිනා වාහන 03 ක් වර්ෂ 01 ත් 02 ත් අතර කාල පරිච්ඡේදයක සිට අලුත්වැඩියා කිරීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) වටිනාකම ගණනය කර නොතිබුණු ජල නළ උපාංග අයිතම 172 ක් නිෂ්ක්‍රීයව පැවතුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------

4.1 අයවැය පාලනය.

------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් අතර ආදායම් විෂයයන් 04 ක සියයට 23 සිට සියයට 102 දක්වා ද, වියදම් විෂයයන් 06 ක සියයට 16 සිට සියයට 67 ක් දක්වා ද විචලනයක් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

4.2 අභ්‍යන්තර විගණනය.

------------------------

මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා පිටපත් විගණකාධිපති වෙත එවා නොතිබුණි.

5. පද්ධති හා පාලනය

----------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| | ---------- | | ----------- |
| (අ) | තොග | i. | ඉන්වෙන්ට්‍රි අයිතම ලේඛනගත නොවීම |
| | | ii. | පැරණි ජල උපකරණ නිෂ්ක්‍රීයව පැවතීම |
| (ආ) | ණයගැති/ ණයහිමි | i. | අවලංගු කර තිබූ කර්මාන්ත සඳහා ණයහිමි ප්‍රතිපාදන සැලසීම |
| | | ii. | ණයහිමියෝ ද්විගණනය වීම |
| | | iii. | පැරණි ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු නොකිරීම |
| (ඇ) | වත්කම් හා දේපළ | i. | ලේඛනය විධිමත් නොවීම |
| | | ii. | ආරක්ෂාව තහවුරු නොවීම |
| | | iii. | වත්කම් වෙන් වෙන්ව හඳුනා ගෙන ගිණුම්ගත නොකිරීම |
| (ඇ) | සේවක කළමනාකරණය | i. | පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම |
| | | ii. | සේවකයින් නියමිත තනතුරෙහි සේවයේ නොයෙදවීම |